

බ්‍රහස්පතින්දා
2012 සැප්තැම්බර් 06
ලක්බිම

මහජන මුදල් කාබාසිනියා කරනවා බලාඉන්න අපට බැහැ >>> 04

ලාංකිකයන්ට තමිල්නාඩුවේදී පහරදීම මානව හිමිකම් කඩකිරීමක් >>> 1

# මැතිවරණ ව්‍යාපාරයේ ප්‍රචණ්ඩත්වය වර්ධනය වෙලා

## ▶ පැෆරල්

❑ ලසන්ත වීරකුලසූරිය/ ගයාණි ගිගනආරච්චි

**පළාත් තුනෙහි සමස්ත ප්‍රචණ්ඩ ක්‍රියා සංඛ්‍යාව 66ක් වන අතර, වැඩිම ප්‍රචණ්ඩ ක්‍රියා ප්‍රතිශතය වන 59.09%ක ප්‍රතිශතය වාර්තා වී ඇත්තේ නැගෙනහිර පළාතෙනි**

**පළාත්** සහා මැතිවරණ ව්‍යාපාරයේ පහරදීම්වලින් මේ වන විට පුද්ගලයන් 30 දෙනෙකු රෝහල්ගත කර ඇතැයි පැෆරල් සංවිධානය පවසයි.

උතුරුමැද, නැගෙනහිර හා සබරගමුව පළාත්වලින් මේ වනවිට පහරදීම් සිද්ධීන් 19ක් පිළිබඳ තොරතුරු ලැබී ඇති අතර. වැඩිම පහරදීම් ප්‍රමාණයක් පිළිබඳ තොරතුරු ලැබී ඇතැයි පැෆරල් සංවිධානයේ විධායක අධ්‍යක්ෂ රෝහණ හෙට්ටිආරච්චි මහතා පැවැසීය.

උතුරුමැද අනුරාධපුර දිස්ත්‍රික්කයේ එකම පක්ෂයේ අපේක්ෂකයන් අතර, ගැටුම් වැඩිවී ඇති අතර, සාමාන්‍ය පුද්ගලයකු වන වෛද්‍යවරයකුටද බරපතළ ලෙස පහරදී ඇත. සබරගමුව පළාත තුළ වැඩිම සිද්ධි ප්‍රමාණයක් වී ඇත්තේ රත්නපුර දිස්ත්‍රික්කයෙනි.

පළාත් තුනෙහි සමස්ත ප්‍රචණ්ඩ ක්‍රියා සංඛ්‍යාව 66ක් වන අතර, වැඩිම ප්‍රචණ්ඩ ක්‍රියා ප්‍රතිශතය වන 59.09%ක ප්‍රතිශතය වාර්තා වී ඇත්තේ නැගෙනහිර පළාතෙනි. එහි පැමිණිලි ලැබී ඇති ප්‍රචණ්ඩ ක්‍රියා සිද්ධි ගණන 39කි. ඊට අමතරව උතුරුමැද පළාතෙන් සිද්ධි 11 (16.66%)ක්, සබරගමුව පළාතෙන් සිද්ධි 16ක් (24.24%)ක් ලැබී ඇතැයි රෝහණ හෙට්ටිආරච්චි මහතා පැවැසීය.

මැතිවරණ ව්‍යාපාරය ආරම්භයේදී එතරම් ප්‍රචණ්ඩත්වයක් දක්නට නොලැබුණ ද මේ වන විට එය ක්‍රමක්‍රමයෙන් වර්ධනය වෙමින් පවතින බවද, හෙතෙම පෙන්වා දුන්නේය.

මෙය මැතිවරණයේ නිදහස් හා සාධාරණ බවට සෘජු බලපෑමක් ඇති කරන බැවින් එක් එක් පක්ෂය විසින් තම ආධාරකරුවන් හා අපේක්ෂකයන් පාලනය කර ගැනිමට කටයුතු කළ යුතුබවද ඔහු අවධාරණය කළේය.